## සංක්ෂේපය

කෘෂිකර්මාන්තයේ නියැළෙන්නන් හට ජනමාධ්‍ය භාවිතා කරමින් කෘෂි දැනුම හා තොරතුරු ලබාදීම අරමුණු කර ගනිමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ශ්‍රව්‍ය-දෘශ්‍ය යන දෙයාකාරයෙන් යුත් රූපවාහිනිය හරහා කෘෂිකාර්මික වැඩසටහන් දෙකක් ඉදිරිපත් කෙරේ. ගොවි ප්‍රජාවට මෙන් ම ගොවිතැනට උනන්දුවක් දක්වන පුද්ගලයින් හට කෘෂිකර්මාන්තය තුළ දිනෙන් දින ජනනය වන නව තාක්ෂණික දැනුමත්, කාලීනව වැදගත්වන කෘෂිකාර්මික තොරතුරුත්, අදාළ කාලය තුළදී ම ලබාදීමත්, එසේ ම ස්වකීය දැනුමත්, කෘෂිකාර්මික ආයතන හරහා ලබාගත් දැනුමත් ඒකරාශී කරගනිමින් කෘෂිකර්මාන්තය තුළ සාර්ථකත්වයට පත් වූ පුද්ගලයින්ගේ අත්දැකීම් ගොවි ප්‍රජාව වෙත ලබාදීම හරහා කෘෂිකර්මාන්තය කෙරෙහි පෙළඹවීමක් ඇති කිරීමත්, මෙම කෘෂිකාර්මික වැඩසටහන් තුළින් අපේක්ෂා කෙරේ. වාර්ෂික ව ඉහළ මූල්‍ය පිරිවැයක් දරමින් ගොවි ප්‍රජාව වෙනුවෙන් සිදු කෙරෙන මෙම කාර්යය පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාර, විද්‍යාත්මක ප්‍රවේශයන් ඔස්සේ අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවය මත ජාතික රූපවාහිනිය හරහා විකාශනය වන “ගොවි බිමට අරුණළු” සහ “මිහිකත දිනුවෝ” යන කෘෂිකාර්මික වැඩසටහන් පාදක කරගනිමින්, ගොවීන්ගෙන් කෙතරම් ප්‍රමාණයක් මෙම වැඩසටහන් නරඹන්නේ ද, එසේ ම වැඩසටහන් ඉදිරිපත් කෙරෙන ආකාරය පිළිබඳ ගොවීන්ගේ කැමැත්ත කුමනාකාර ද, වැඩසටහන් හරහා ගොවීන් ලබාගත් දැනුමේ ප්‍රයෝජනවත්භාවය, කෙසේ ද, වැඩසටහන් නැරඹීමේ දී පවතින බාධාවන් කවරේ ද, එමෙන් ම මෙම වැඩසටහන් ඵලදායකවීමට ගොවීන්ගේ යෝජනා කවරේ ද, යන්න පිළිබඳව ගොවි ප්‍රතිචාර විමසා බැලීම අධ්‍යයනයේ අරමුණු විය.

මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් ගොවීන්ගේ ප්‍රතිචාරයන් හා සම්බන්ධ වන බැවින් ජාතික රූපවාහිනිය වඩාත් හොඳින් දර්ශනය වන හා විවිධ දේශගුණික තත්ත්වයන් සහිත විවිධ බෝග වගා කළ හැකි යන නිර්ණායකයන් පිළිබඳ සැලකිලිමත් වෙමින් කුරුණෑගල දිස්ත්‍රික්කය තෝරාගෙන ඇති අතර එයට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 11ක් ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා උපයෝගී කරගන්නා ලදි, බහු පියවර නියැදි ක්‍රමයට නියැදිය තෝරාගත් අතර අදාළ දිස්ත්‍රික්කයේ දේශගුණික කලාප තුනට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාවට සමානුපාතික වන සේ තෝරා ගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 11ක කෘ.ප.නි.ස. වසම් 22කට අයත් ගොවීන් 330න් සමන්විත වූ නියැදියක් වෙත ඉදිරිපත් කරන ලද ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් අධ්‍යයනයට අවශ්‍ය ප්‍රාථමික දත්ත සපයා ගන්නා ලදී,

ද්විතියික දත්ත සඳහා සාහිත්‍ය විමර්ශනය හා කෘෂිකාර්මික වැඩසටහන් ඉදිරිපත් කිරීම හා සම්බන්ධ නිලධාරීන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය-දෘශ්‍ය ඒකකයට අයත් වෙනත් අදාළ නිලධාරීන් හා සිදු කළ සාකච්ඡා තුළින් තොරතුරු සපයා ගන්නා ලදී,

අධ්‍යයනයෙන් හෙළි වූ කරුණුවලට අනුව, ප්‍රදේශයේ ජාතික රූපවාහිනී නාලිකාව නරඹන ගොවීන්ගෙන් 75%ක් ම කෘෂිකාර්මික වැඩසටහන් නරඹති. වැඩසටහන් නරඹන්නේ නැති ගොවීන්ගෙන් 78%ක් ඊට දැක් වූ ප්‍රධාන හේතුව වූයේ, නිවසේ සහ දරුවන්ගේ කටයුතුවලට බාධා වන බැවින් රූපවාහිනී වැඩසටහන් නැරඹීමෙන් වැළකී සිටින බවයි. වැඩසටහන් නරඹන ගොවීන්ගෙන් 86%ක් ම මෙම වැඩසටහන් පිළිබඳ මුළින් ම දැනුවත් වී ඇත්තේ, වෙනත් වැඩසටහන් නැරඹීමට රූපවාහිනිය ක්‍රියාත්මක කරන විට

අහම්බෙන් වන අතර, ප්‍රදේශයේ කෘ.ප.නි.ස.වරයාගෙන් සහ අසල්වැසි ගොවීන්ගෙන් දැනුවත් වූ ගොවීන් ද සිටියහ.

කෘෂිකාර්මික වැඩසටහන් "නිතරම"(33%) සහ "කලාතුරකින්" (26%) නරඹන ගොවීන්ට සාපේක්ෂව "ඉඳහිට" නරඹන සංඛ්‍යාව(41%) ඉහළ ය. එසේ ම වැඩසටහන් අතරින් "ගොවි බිමට අරුණළු" වැඩසටහන සමස්ත ගොවීන්ගෙන් වැඩි ප්‍රතිශතයක් (34%) නරඹති.

මෙම වැඩසටහන් ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාරය විමසීමේ දී ගොවීන්ගෙන් 80%ක් සඳහන් කළේ, වැඩසටහන් හි භාවිතා කරන භාෂා ශෛලිය, ඉදිරිපත් කරන කරුණු, ඉදිරිපත් කිරීමේ විලාසය වඩාත් සුදුසු බවයි. වැඩසටහන් තුළ සංශෝධනයට ලක් කළ යුතු අංගයන් ලෙසින් ගොවීන් වැඩි ප්‍රතිචාරයක් දැක්වූයේ වැඩසටහන් හි විකාශන වේලාව හා විකාශන කාල පරාසයයි. එනම් පිළිවෙළින් "ගොවි බිමට අරුණළු" සඳහා 76%ක් ද "මිහිකත දිනුවෝ" සඳහා 84%ක් ද වශයෙනි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයක් නොමැති වුවත් ජාතික රූපවාහිනිය හරහා විකාශය වන බැවින් හා ගොවීන්ගේ ප්‍රතිචාර පැවති බැවින් ඉහත සඳහන් කළ ප්‍රධාන කෘෂි වැඩසටහන් දෙකට අමතරව විකාශය වන වැඩසටහන් දෙකක් ගැන ද ගොවි ප්‍රතිචාර විමසා බැලිණි. ඒ අනුව, "රිවිදින අරුණැල්ල" සහ "සැගවුණු කතාවනු" යන වැඩසටහන් දෙකෙහි ද වේලාව හා කාල පරාසය සංශෝධනය කළ යුතු බවට පිළිවෙළින් "රිවිදින අරුනැල්ල" සඳහා 69%ක් ද සහ "සැගවුණු කතාවනු" සඳහා 71%ක් ද වශයෙන් ප්‍රතිචාර දක්වා තිබිණි.

ප්‍රතිචාර දැක් වූ ගොවීන් සියලුදෙනාට ම එය ප්‍රයෝජනවත් වී ඇති අතර "වඩාත් ප්‍රයෝජනවත්" යැයි කියූ පිරිස 35%ක් වන අතර "ප්‍රයෝජනවත්" යැයි කියූ පිරිස 65%කි. ප්‍රයෝජනවත් වූ ආකාරය විමසීමේ දී බෝග වගා කිරීමේ දී විවිධ වූ වගා ක්‍රමයන් අත්හදා බැලීමටත්, ඒවා ක්‍රියාත්මක කිරීමටත් මෙම වැඩසටහන් නැරඹීමෙන් ලද දැනුම ප්‍රයෝජනවත් වූ බවට ගොවීන්ගෙන් 88%ක් ප්‍රතිචාර දැක් වූ අතර, කාබනික පොහොර නිෂ්පාදනය හා යෙදීම පිළිබඳ දැනුම ලැබුණු බවට 75%ක් සහ වගාවන්ට වැළඳෙන පළිබෝධ හා රෝග පාලනය සඳහා දැනුම ලැබුණු බවට 69%ක් ප්‍රතිචාර දැක්වූහ.

වැඩසටහන් විකාශය වන වේලාවන්හි නිවසේ කාර්ය බහුලභාවය වැඩිවීම නිසා වැඩසටහන් නැරඹීමට අවකාශ නොලැබීම(96%), දරුවන්ගේ අධ්‍යාපනික කටයුතුවලට බාධා වීම(91%), අතරතුර කාලයේ වෙළඳ දැන්වීම් ප්‍රචාරය(74%) වැනි කරුණු වැඩසටහන් නැරඹීමේ දී පවතින බාධාවන් ලෙස ගොවීහු සඳහන් කළහ.

ගොවීන්ගෙන් 98%ක ගේ අදහස වූයේ, වැඩසටහන් ඵලදායක වීමට නම් එම වැඩසටහන් රාත්‍රී 9.00-10.00 අතර විකාශය වීම සුදුසු බවයි. එසේ ම 95%ක් සඳහන් කළේ, කාලපරාසය ද විනාඩි 15 ට වඩා දීර්ඝ කළ යුතු බවයි.

අධ්‍යයන සොයා ගැනීම් අනුව නිගමනය කළ හැකි වන්නේ, අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන් වැඩි පිරිසක් කෘෂිකාර්මික වැඩසටහන් නරඹන බවත් එසේ නරඹා තම ගොවිතැන් කටයුතු සඳහා දැනුම හා තොරතුරු ලබා ගන්නා බවත් ය. නමුත් වැඩසටහන් හි විකාශන වේලාව හා කාල පරාසය පිළිබඳ ගොවීන් තෘප්තිමත් නොවන අතර, වැඩසටහන් ගැන ගොවීන් අහම්බෙන් දැනුවත් වීමක් මිස ඔවුන් ව දැනුවත් කිරීමේ ක්‍රමයක් ද නොපවතින බව පෙනුණි. එසේ ම ගොවීන්ගේ පාර්ශවයෙන් ඔවුන්ට මෙම වැඩසටහන් නැරඹිය හැකි වේලාව නුසුදුසු බවත් අතරතුර කාලයේ වෙළෙඳ දැන්වීම් නිසා බාධාවන් සිදු වන බවත් අනාවරණය විය. මෙම තත්වයන් සඳහා පිළියම් යෙදීම මගින් වැඩසටහන් හි ඵලදායකත්වය වර්ධනය කරගැනීමේ හැකියාවක් පවතින බව ද අනාවරණය විය. මේ සඳහා අධ්‍යයනය විසින් යෝජනා කිහිපයක් ඉදිරිපත් කෙරේ. එනම් ගොවීන්ට සුදුසු හා ඔවුන් අපේක්ෂා කරන වේලාවක කෘෂිකාර්මික වැඩසටහන් විකාශය කිරීම, වැඩසටහන් හි කාල පරාසය දීර්ඝ කිරීම, වැඩසටහන් පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ පුළුල් ප්‍රචාරක ක්‍රමයක් අනුගමනය කිරීම, වැඩසටහන් විකාශය වන කාල පරාසය තුළ වෙළෙඳ දැන්වීම් සඳහා වන කාලය අවම කිරීම සහ අන්තර්ගතය සඳහා නවාංග ඇතුළත් කිරීම හරහා ගොවීන් තව දුරටත් ආකර්ශනය කරගැනීමේ ක්‍රමයක් සකස් කිරීමත් වේ.